# ආරක්ෂක මණ්ඩලය

2015 දෙසැම්බර් 9

# 2250 (2015) යෝජනාව

## 2015 දෙසැම්බර් 09 වන දින ආරක්ෂක මණ්ඩලයේ 7573 වන රැස්වීමේදී සම්මත කරගන්නා ලදී.

ආරක්ෂක මණ්ඩලය,

කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ 1325 (2000), 1820 (2008), 1889 (2009), 1960 (2010), 2106 (2013), 2122 (2013) සහ 2242 (2015) යන සිය යෝජනාවන් සහ සිය සභාපතිතුමාගේ සියලු අදළ ප්‍රකාශයන්ද, 2178 (2014), සහ 2195 (2014) යන ත්‍රස්තවාදයට එරෙහි සිය යෝජනාවන් සහ සිය සභාපතිතුමාගේ S/PRST/2015/11 දරන ප්‍රකාශයද, S/PRST/2012/29 සහ S/PRST/2015/2 දරන පශ්චාත් ගැටුම් තත්වයක් තුල සාමය ගොඩනැගීම පිළිබඳ ප්‍රකාශයන්ද සිහිගන්වමින්,

සන්නද්ධ ගැටුම් වලදී සිවිල් ජනතාවගේ ආරක්ෂාව පිළිබඳ 1265 (1999) සහ 1894 (2009) යන සිය යෝජනා සිහිගන්වමින්,

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි අභිමතාර්ථයන් සහ මූලධර්ම සහ, ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වා ගැනීමේ ප්‍රඥප්තිය යටතේ ආරක්ෂක මණ්ඩලයේ මූලික වගකීම සිත්හි දරාගනිමින්,

මෙම යෝජනාවේ සංදර්භය තුල යෞවනයින් ලෙස අර්ථ දක්වා ඇත්තේ වයස 18-29 අතර වන පුද්ගලයින් බව සටහන් කර ගනිමින්, A/RES/50/81 සහ A/RES/56/117 යන මහා මණ්ඩල යෝජනාවල යෞවනයින් අර්ථ දක්වා ඇති ආකාරය ඇතුළුව ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ මෙම වචනයේ අර්ථ දැක්වීමේ වෙනස්වීම් සිදුවිය හැකි බවද තවදුරටත් සටහන් කර ගනිමින්,

වර්තමාන යෞවන පරපුර ලොව මෙතෙක් දැනසිටි විශාලතම යොවුන් පරපුර බවත්. සන්නද්ධ ගැටුම්වලින් පීඩාවට පත් රටවල ජනගහණයෙන් වැඩි ප්‍රමාණයක් යෞවනයින් ගෙන් සැදුම්ලත් බවත් හඳුනාගනිමින්,

සරණාගතයින් සහ අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් ඇතුළුව, සිවිල් ජනතාව අතුරින් සන්නද්ධ ගැටුම්වලින් අයහපත් බලපෑම් ඇති වූ බොහෝ දෙනෙකු යෞවනයින් වීම ද, යෞවනයින්ගේ අධ්‍යාපනයට සහ ආර්ථික අවස්ථාවන්ට බාධා ඇති වීම දිගුකාලීන සාමයට සහ සංහිදියාවට බරපතල බලපෑමක් ඇති වීම පිළිබඳ සැලකිල්ල ප්‍රකාශ කරමින්,

සාමය සහ ආරක්ෂාව පවත්වාගැනීම සහ ප්‍රවර්ධනය කිරීමේ පරිශ්‍රමයේදී යෞවනයින්ගේ ධනාත්මක දයකත්වයෙහි වැදගත්කම හඳුනාගනිමින්,

ගැටුම් වලක්වා ගැනීමේදී සහ නිරාකරණය කිරීමේදී සහ, සාමය ගොඩනැගීමේදී සහ සාමසාධනයේ සාර්ථකත්වය තිරසාරබව සහ පූර්ණත්වය ලඟා කර ගැනීමේ ප්‍රධාන සාධකයක් ලෙස යෞවනයින්ට සිදු කළ හැකි වැදගත් කාර්යභාරය අවධාරණය කරමින්,

**තාක්ෂණික හේතුන් මත 2016 ජනවාරි 05 වන දින නැවත නිකුත්කරන ලදී.***

දිගුකාලීන සාමය ඇතිකරලීම සඳහා ක්‍රියාකාරී සහභාගිත්වය සඳහා සහ සාධාරණත්වය සහ සංහිදියාව සඳහා දයක වීමට යෞවනයින් එක්විය යුතු අතර, අන්තර්ගත ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක වන්නේ නම් පවතින විශාල

යෞවන ජනගහණය දිගුකාලීන සාමයට සහ ආර්ථික සෞභාග්‍යයට හේතු විය හැකි අද්විතීය සමාජ විද්‍යාත්මක ප්‍රතිලාභයක් විය හැකි බව හඳුනාගනිමින්,

විශේෂයෙන්ම යෞවනයින් අතර ප්‍රචණ්ඩත්වය සහ අන්තවාදී ප්‍රචණ්ඩත්වය ඉහළ යාමේ රැඩිකල්වාදීබව ස්ථාවරත්වයට සහ සංවර්ධනයට තර්ජනයක් විය හැකි වීම සහ, එම තත්වය සාමය ගොඩනැගීමේ ප්‍රයත්නයන් බිඳවැටීමට සහ ගැටුම් ඇවිස්සීමට හේතුවිය හැකි බවත්, ත්‍රස්තවාදයට උපකාරී විය හැකි යෞවනයින් අතර ප්‍රචණ්ඩත්වය සහ අන්තවාදී ප්‍රචණ්ඩත්වය ඉහළ යාමේ රැඩිකල්වාදී බවට හේතුවිය හැකි තත්වයන් සහ සාධක කෙරෙහි යොමුවීමේ වැදගත්කම හඳුනාගනිමින්,

ත්‍රස්තවාදී ක්‍රියාවන් සඳහා යෞවනයින් බඳවාගැනීමට සහ ඔවුන් ඒ සඳහා පෙළඹවීම සඳහා ද, සිය ක්‍රියාකාරකම් සඳහා මුදල් යෙදවීම, සැලසුම් කිරීම සහ සකස් කිරීම සඳහා ද ගෝලීය සමාජයක් තුළ ත්‍රස්තවාදීන් සහ ඔවුන්ට සහාය දක්වන්නන් විසින් නව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය බහුල වශයෙන් යොදාගැනීම පිළිබඳව සැලකිල්ල යොමුකරමින්, මානව හිමිකම්වලට සහ මූලික නිදහසට ගරුකරමින් සහ ජාත්‍යන්තර නීති යටතේ ගැනෙන අනෙකුත් බැඳීම්වලට අනුකූලතාවය දක්වන අතර ත්‍රස්තවාදී ක්‍රියාවන්ට උපකාර කර ගැනීම සඳහා ත්‍රස්තවාදීන් විසින් තාක්ෂණය, සන්නිවේදනය සහ සම්පත් අයුතු ලෙස යොදාගැනීම වැළැක්වීම සඳහා සාමාජික රටවල් සහයෝගයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාව අවබෝධකර ගනිමින්,

ත්‍රස්තවාදයට උපකාරී වියහැකි, ගැටුම් වැඩිවීමට හේතුවිය හැකි, සමාජ ආර්ථික සංවර්ධනයට බාධා ගෙනදෙන සහ කලාපීය සහ ජාත්‍යන්තර අනාරක්ෂිත බවට රුකුල් දෙන අන්තවාදී ප්‍රචණ්ඩත්වයට එරෙහිව සහ එය වැළැක්වීමට හැකි ධනාත්මක සහ ආදර්ශවත් භූමිකාවක් ලෙස යෞවනයින්ට සිදු කළ හැකි වැදගත් කාර්යභාරය පිළිබඳව සටහන් කර ගනිමින්,

මහ ලේකම් වරයා විසින් යෞවනයින්ගේ සහභාගිත්වය, නායකත්වය සහ බලගැන්වීම එක්සත් ජාතීන්ගේ ක්‍රමෝපාය සහ ප්‍රතිචාර වල හරය ලෙස සලකමින් අන්තවාදී ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් අවසන් කරමින් සිටින බව සටහන්කර ගනිමින්,

යෞවනයින් සඳහා වන ලෝක ක්‍රියාකාරී වැඩසටහන; සාමය ගොඩනැගීම සඳහා යෞවනයින්ගේ සහභාගිත්වය සඳහා මගපෙන්වීමේ ප්‍රතිපත්ති; 2015 අගෝස්තු මස පැවැත්වූ යෞවනය, සාමය සහ ආරක්ෂාව පිළිබඳ ගෝලීය සංසදය; යෞවනය, සාමය සහ ආරක්ෂාව පිළිබඳ අම්මාන් ප්‍රකාශය; 2015 සැප්තැම්බර් මස පැවැත්වූ අන්තවාදී ප්‍රචණ්ඩත්වයට එරෙහි යෞවන සමුළුව පිළිබඳව සටහන්කර ගනිමින් සහ ගැටුම් සහිත සහ පශ්චාත් ගැටුම් තත්වයන් තුළ සාමය ගොඩනැගීම සඳහා යෞවනයින්ගේ සහභාගිත්වය සහ ධනාත්මක දායකත්වය සඳහා පදනමක් සකස් කිරීම සඳහා ඒවායේ කාර්යභාරය වටහාගනිමින්,

ජාතික රජයන් සහ කලාපීය සහ ජාත්‍යන්තර සංවිධාන විසින් සාමය ගොඩනැගීම සහ පවත්වාගැනීම සඳහා යෞවනයින් සහභාගි කර ගැනීම සඳහා දැනට සිදුකරන කාර්යයන් පිළිගනිමින්,

ගැටුම් වළක්වා දිගුකාලීන ස්ථාවරත්වය සහ තිරසාර සාමය සඳහා අන්තර්ගත සංවර්ධනය සඳහා එක්සත් ජාතීන්ගේ පොදු ප්‍රවේශයක් ඇති කිරීම සඳහා සාමාජික රටවල් දිරිගන්වමින්, මෙම කාර්යයේදී ගැටුම්වලට හේතුකාරකයින් ලෙස සමාජයීය, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික සහ ආගමික බැහැරකිරීම්, නොසලකාහැරීම් මෙන්ම ත්‍රස්තවාදයට හිතකර විය හැකි අන්තවාදී ප්‍රචණ්ඩත්වය හඳුනාගැනීමේ වැදගත්කම ඉස්මතු කරමින්,

ගැටුම් පවතින අවස්ථාවලදී සහ පශ්චාත් ගැටුම් අවධියේදී තරුණයන් ආරක්ෂා කරගැනීම සහ ඔවුන් සාම ක්‍රියාවලියෙහි නියුක්ත වීම ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගැනීම සඳහා සැලකියයුතු දායකත්වයක් සපයන බව පිළිගනිමින් සහ, ගැටුම් නිරාකරණය කිරීම සඳහා සහ සාමය ගොඩනැගීම සඳහා වන ඕනෑම පුළුල් උපායමාර්ගයක් සඳහා යෞවනයින්ද ඇතුළු සිවිල් වැසියන්ගේ ආරක්ෂාව වැදගත් අංගයක් බවට විශ්වාස කරමින්,

ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ආඥපනතේ අදාළ නියෝග සටහන් කර ගනිමින්,

**සහභාගිත්වය**

1. ත්‍රස්තවාදයට උපකාර වියහැකි අන්තගාමී ප්‍රචණ්ඩත්වයට එරෙහි කලාපීය ආයතන සහ යාන්ත්‍රණයන් ඇතුළුව, ප්‍රාදේශීය, ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ආයතනයන්ගේ සෑම මට්ටමකම තීරණ ගැනීමේ කාර්යය සඳහා අන්තර්ගත යෞවන නියෝජනය වැඩි කිරීමේ ක්‍රම පිළිබඳව සලකා බැලීමට සහ, අදාළ පරිදි, සාම ක්‍රියාවලිය සහ ආරවුල් නිරාකරණය සඳහා අර්ථවත් යෞවන සහභාගිත්වය සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයන් පිහිටුවීම පිළිබඳව සලකා බලන ලෙස සාමාජික රටවලට අවධාරණය කරනු ලැබේ.

2. යෞවනයින් නොසලකා හැරීම පහත සඳහන් විශේෂිත අංශයන්ද ඇතුළුව අනෙකුත් කරුණු හේතුකොටගෙන සෑම සමාජයකම තිරසාර සාමයක් ගොඩනැගීම සඳහා අහිතකර වන බව පිළිගනිමින්, ගිවිසුම් සාකච්ඡා කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුළුව, අදාළ පරිදි, යෞවන සහභාගිත්වය සහ අදහස් පිළිගැනීම සිදුකරන ලෙස අදාළ ක්‍රියාකාරීන්ගෙන් ඉල්ලා සිටීඃ

(අ) නැවත සියරට පැමිණවීම, නැවත පදිංචිකිරීම, පුනරුත්ථාපනය සහ පශ්චාත්-ගැටුම් ප්‍රතිසංස්කරණයේදී යෞවන අවශ්‍යතාවන්;

(ආ) ප්‍රාදේශීය යෞවන සාම වැඩසටහන්වලට සහ ගැටුම් නිරාකරණය පිළිබඳ දේශීය ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට පියවර ගැනීම සහ, සාම ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයේදී යෞවනයින් සහභාගි කරවා ගැනීම;

(ඇ) සාමය ගොඩනැගීමේ සහ ගැටුම් නිරාකරණය කිරීමේදී යෞවනයින් බලගැන්වීමට පියවර ගැනීම;

3. ආරක්ෂක මණ්ඩල දූත මෙහෙයුම්වලදී දේශීය සහ විදේශීය යොවුන් කණ්ඩායම් සමග අදාළ පරිදි, උපදෙස් ලබාගැනීම ඇතුළු, යෞවනයින් හා සම්බන්ධ සලකා බැලීම් සිදුකිරීමේ වැදගත්කම අවධාරණය කර සිටී;

**ආරක්ෂාව**

4. 1949 ජිනීවා ප්‍රඥප්තියෙන් සහ 1977 දී ඊට එකතු කරන ලද මූල ලේඛනයන්ගෙන් යෙදෙන බැඳීම්ද ඇතුළුව ජාත්‍යන්තර නීතිය යටතේ යෞවනයින්ද ඇතුළු සිවිල් ජනතාවගේ ආරක්ෂාවට අදාළ බැඳීම් තරයේ ගරු කරන ලෙස සන්නද්ධ අරගලයන්ගේ යෙදෙන පාර්ශව වෙතින් ඉල්ලා සිටිනු ලැබේ;

5. සරණාගතයින්ගේ තත්වය හා සම්බන්ධ 1951 ප්‍රඥප්තිය හා 1967 දී ඊට එක්කළ මූල ලේඛනයන්ද, කාන්තාවන්ට එරෙහි සෑම ආකාරයකම වෙනස්කොට සැලකීම් ඉවත් කිරීම පිළිබඳ 1971 ප්‍රඥප්තිය හා 1999 දී ඊට එක් කළ වෛකල්පික මූල ලේඛනයන් සහ, ආබාධිත පුද්ගලයින්ගේ අයිතීන් පිළිබඳ ප්‍රතිඥාව තුළින් යෙදිය යුතු බැඳීම්වලට අනුගත වන ලෙස සියලු රාජ්‍යයන්ගෙන් තවදුරටත් ඉල්ලා සිටී;

6. ජාත්‍යන්තරව අදාළවන ඉතා බරපතල අපරාධ සඳහා දඬුවම් නොලබා සිටීමට විරුද්ධ සටන ජාත්‍යන්තර අපරාධ අධිකරණය, තත්කාර්ය සහ මිශ්‍ර අධිකරණයන් සහ විශේෂ ජාතික අධිකරණයන් මගින් සවිමත් කර ඇති බව සටහන් කර ගනිමින්, යෞවනයින්ද ඇතුළු සිවිල් වැසියන්ට එරෙහිව සිදු කරන ලද ජන සංහාරය, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ, යුද අපරාධ සහ ඉතා බරපතල අපරාධ සඳහා දඬුවම් නොලබා සිටීම අවසන් කරමින් සිය අදාළ බැඳීම්වලට අනුගත වන ලෙස සාමාජික රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ;

7. යෞවනයින්ද ඇතුළු සිවිල් වැසියන් සෑම ආකාරයකම ලිංගික හිංසනයන්ගෙන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රචණ්ඩත්වයන්ගෙන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් සන්නද්ධ අරගලවලට සම්බන්ධ සෑම පාර්ශවයන්ගෙන්ම ඉල්ලා සිටිනු ලැබේ;

8. අදාළ ජාත්‍යන්තර නීතියෙන් ඉඩ සලසා ඇති පරිදි යෞවනයින්ද ඇතුළු සෑම පුද්ගලයෙකුගේම මානව අයිතීන්ට ගරු කිරීමට සහ තහවුරු කිරීමට රාජ්‍යයන් කටයුතු කළ යුතු බව යළි අවධාරණය කරන අතර, සෑම රාජ්‍යයක්ම ජන සංහාරයෙන්, යුද අපරාධවලින්, ජනවාර්ගික සංහාරයන්ගෙන් සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධවලින් සිය වැසියන් ආරක්ෂා කිරීම මූලික වගකීමක් ලෙස සැලකිය යුතු බවද යළි අවධාරණය කෙරේ;

9. ජාත්‍යන්තර නීතියට අනුකූල වන පරිදි සන්නද්ධ අරගලවලදී සහ පශ්චාත් අරගල සමයේදී යෞවනයින් ඇතුළු සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සඳහා විශේෂ පියවරයන් ගන්නා ලෙස සාමාජික රාජ්‍යයන්ට ආයාචනා කර සිටී;

**වළක්වාගැනීම**

10. විවිධ පසුබිම්වලින් පැමිණෙන යෞවනයින් ඇතුළු යොවුන් ක්‍රියාකාරීන්ට ප්‍රචණ්ඩත්වය වළක්වන සහ සමාජ ඒකාබද්ධතාවයට උපකාරී වන ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් සහාය ලබාගැනීමට හැකිවන අන්තර්ගත පරිසරයක් සඳහා පහසුකම් සපයන ලෙස සාමාජික රාජ්‍යයන්ගෙන් ආයාචනා කර සිටී;

11. සමාජ සහ ආර්ථික සංවර්ධනය, ප්‍රාදේශීය ආර්ථිකය වර්ධනය කිරීම සඳහා සැලසුම් කර ඇති ව්‍යාපෘතීන්ට සහාය දැක්වීම සහ, යොවුන් රැකියා සහ වෘත්තීය අධ්‍යාපනය සඳහා අවස්ථා ඇති කිරීම, ඔවුන්ගේ අධ්‍යාපනයට රුකුල් දීම සහ යෞවන ව්‍යවසායන් සහ අර්ථකාරී දේශපාලන ක්‍රියාකාරකම් ඇතුළු සාමය ගොඩනැගීමේ ආයාසයන්ට ධනාත්මකව දායකවන යෞවනයින් සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ වැදගත්කම අවධාරණය කරනු ලැබේ;

12. සිවිල් ව්‍යුහයන් තුල සහ අන්තර්ගත දේශපාලන ක්‍රියාවලියක් සඳහා නිර්මානශීලීව යෙදීමේ හැකියාව ලබාදෙන සාමය සඳහා වන ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා අදළ පරිදි සහාය දක්වන ලෙස සාමාජික රාජ්‍යයන්ගේ ආයාචනා කර සිටී;

13. යෞවනයින් සහභාගිවන සාමකාමී සංස්කෘතියක්, ඉවසීම, අන්තර් සංස්කෘතික සහ අන්තර් ආගමික සංවාදය ප්‍රවර්ධනය කරන සහ ඔවුන් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්, ත්‍රස්තවාදය, අපීතිභීතිකාව සහ සෑම ආකාරයකම වෙනස්කම් කිරීමේ ක්‍රියාවල යෙදීම අධෛර්යමත් කිරීමටත් අවශ්‍ය යාන්ත්‍රණයන් ආයතනගත කිරීමටත් සලකා බලන ලෙස අදළ සෑම ක්‍රියාකාරීන්ගෙන්ම ඉල්ලා සිටිනු ලැබේ;

**හවුල්කාරිත්වයන්**

14. අදාල අරමුදල් සහ වැඩසටහන් සිදුකරන අනෙකුත් ආයතනයන්ද ඇතුළු එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අනුග්‍රාහක කාර්යාලය, එක්සත් ජාතීන්ගේ සාම අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල, එක්සත් ජාතීන්ගේ කාන්තාවෝ, සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය, මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය, මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය සහ අයෙකුත් අදළ ආයතන සහ කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රියාකාරීන් හා එක්ව, ගැටුම් සහිත සහ පශ්චාත් ගැටුම් තත්වයන් තුළ සාම ආයාසයන් සඳහා යෞවනයින්ගේ අවශ්‍යතාවන් සහ සහභාගිත්වය සැලකිල්ලට ගන්නා පරිදි ඔවුන්ගේ දේශපාලනික, මූල්‍යමය, තාක්ෂණික සහ උපායමාර්ගික සහයෝගය, අදාළ පරිදි, වැඩි කරන මෙන් සාමාජික රාජ්‍යයන්ගෙන් ආයාචනය කර සිටී;

15. ත්‍රස්තවාදයට හිතකර විය හැකි තරුණයන් අතර රැඩිකල්වාදී ප්‍රචණ්ඩත්වය සහ අන්තවාදී ප්‍රචණ්ඩත්වය වැඩිවීමට හේතුවන තත්වයන් සහ සාධක කෙරෙහි යොමුවී ඇති සිය සාමය ගොඩ නැගීමේ මූලෝපායයන් සහ සන්නද්ධ ගැටුම් පවතින කාලය තුළ සහ ඉන් පසුව උපදෙස් සහ නිර්දේශයන් තුළ සාමය ගොඩනැගීමේ කොමිෂන් සභාවේ වැදගත් කාර්යභාරය අවධාරණය කර සිටී;

16. යෞවනයින්, පවුල්, කාන්තාවන්, ආගමික, සංස්කෘතික සහ අධ්‍යාපනික නායකයින් සහ සිවිල් සමාජයේ මේ පිළිබඳව සැලකිල්ලක් දක්වන සෑම කණ්ඩායමක්ම බලගැන්වීම සහ මෙවැනි අන්තවාදී ප්‍රචණ්ඩත්වයන් සඳහා බඳවාගැනීම්වලට එරෙහිවන සහ සමාජ එකමුතුව සහ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කරන සැලසුම් සඳහා ප්‍රවේශයන් යොදගැනීම ඇතුළු ත්‍රස්තවාදී ක්‍රියාවන්ට අනුබලදෙන අන්තවාදී ප්‍රචණ්ඩත්වයට එරෙහිවන ක්‍රමෝපායයන් වර්ධනය කිරිමට අදළ ප්‍රදේශීය ප්‍රජාවන් සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් යොද ගැනීමට සාමාජික රාජ්‍යයන් දිරිගන්වනු ලැබේ;

**නිදහස්කිරීම සහ ප්‍රතිසමෝධානය**

17. පහත සඳහන් විශේෂිත අංශයන් ඇතුළු සන්නද්ධ ගැටුම්වලින් පීඩාවට පත් යෞවනයින්ගේ අවශ්‍යතා සලකා බැලීමට නිරායුධකරණය, හමුදාවන් මුදාහැරීම සහ ප්‍රතිසමෝධානය කිරීමේ යෙදී සිටින සැම දිරිගන්වනු ලැබේ:

(අ) සාක්ෂිමත පාදකවූ සහ, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී යෞවන රැකියා අවස්ථා, යෝග්‍ය කම්කරු ප්‍රතිපත්ති, අධ්‍යාපනයේ කාරයභාරය හඳුනාගනිමින් යෞවන සහභාගිත්වය ඇතිව පුද්ගලික අංශය සමග හවුල්කාරිත්වයෙන් සිදුකරන ජාතික යෞවන රැකියා ක්‍රියාකාරී සැලසුම්, යෞවනයින් කොන්කිරීම වළක්වන රැකියා සහ පුහුණු කිරීම්;

(ආ) සාමය පිළිබඳ හැඳියාවක් ප්‍රවර්ධනය වන පරිදි සැලසුම් කළ යෝග්‍ය අධ්‍යාපන අවස්ථා හරහා යෞවනයින්ගේ හැකියාවන් සහ නිපුණත්වයන් ගොඩනැංවීම සඳහා ආයෝජනය කිරීම;

(ඇ) යෞවන රැකියා සහ ව්‍යවසායකත්ව වැඩසටහන් සඳහා හවුල්කරුවන් ලෙස යෞවනයින් විසින් නායකත්වය ගන්නා සහ සාමය ගොඩනංවන සංවිධානවලට සහාය ලබාදීම;

18. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 41 වන ඡේදය යටතේ පියවර ගන්නා අවස්ථාවලදී ඒමගින් යෞවනයින් ඇතුළු ජනගහණයට සිදුවිය හැකි බලපෑම පිළිබඳව සටහන් කර ගනු ලැබේ;

**ඉදිරි පියවර**

19. සන්නද්ධ ගැටුම් වලදී සහ පශ්චාත් ගැටුම් අවස්ථාවලදී යෞවනයින්ගේ අවශ්‍යතා පිළිබඳව සම්බන්ධීකරණය සහ අන්තර්-ක්‍රියාවන් වැඩිදියුණු කරන ලෙස යෞවනයින් පිළිබඳ මහලේකම් වරයාගේ නියෝජිතයා සහ සරණාගතයින් පිළිබඳ විශේෂ නියෝජිතයා ඇතුළු මහලේකම් වරයාගේ විශේෂ නියෝජිතයින්ට සහ එක්සත් ජාතීන්ගේ අදළ අංශයන්ට ආරාධනය කරනු ලැබේ;

20. ප්‍රාදේශීය, ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමෙන් ඵලදායී ප්‍රතිචාරයන් නිර්දේශ කිරීම සඳහා සාම ක්‍රියාවලියට සහ ගැටුම් නිරාකරණයට යෞවනයින්ගේ ධනාත්මක දායකත්වය සම්බන්ධයෙන් ප්‍රගති අධ්‍යයනයක් සිදුකරන ලෙස මහලේකම් වරයාගෙන් ඉල්ලා සිටින අතර, මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල ආරක්ෂක මණ්ඩලයට සහ එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රාජ්‍යයන්ට ලබා දෙන ලෙස තවදුරටත් ඉල්ලා සිටිනු ලැබේ;

21. එමෙන්ම, සන්නද්ධ ගැටුම් සහිත තත්වයන්හිදී යෞවනයින්ගේ තොරතුරු සහ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම යටතේ වළක්වාගැනීම, හවුල්කාරිත්වය, සහභාගිත්වය, ආරක්ෂාව, දායකත්වය, මුදවාගැනීම සහ ප්‍රතිසමෝධානය සම්බන්ධයෙන් පවතින පියවර ආරක්ෂක මණ්ඩලයේ න්‍යායපත්‍රයේ ඇතුළත් කරුණු යටතේ සිය වාර්තාවන්ට ඇතුළත් කරන මෙන්ද මහලේකම් වරයාගෙන් ඉල්ලා සිටී;

22. මෙම කරුණ සම්බන්ධයෙන් ක්‍රියාකාරීව අවධානයෙන් සිටීමට තීරණය කරන ලදී.